**UNIVERSITY OF PERADENIYA**
**CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION**

ශාස්ත්‍රවේදී උපාධි (බාහිර - නව නිර්දේශය) පරීක්ෂණය 200 මට්ටම - 2024 මාර්තු
கலைத்தேர்வுப் பரீட்சை (வெளிவாரி-புதிய பாடத்திட்டம்) 200 வது தேர்ச்சி மட்டம் – மார்ச் 2024
**Bachelor of Arts (External - New Syllabus) Examination 200 Level – March 2024**

**(SUPE 208)**
**ආපදා කළමනාකරණය /Disaster Management**

කාලය පැය(03) තුනයි
மூன்று (03) மணித்தியாலங்கள்.
Time three **(03)** Hours.

නොපැහැදිලි අත් අකුරුවලට ලකුණු කපනු ලැබේ
எழுத்து தெளிவில்லாதவிடத்து புள்ளிகள் குறைக்கப்படும்.
Marks will be deducted for illegible hand writing.

ප්‍රශ්න 04 පිළිතුරු සපයන්න
04 வினாக்களுக்கு மட்டும் விடையளிக்க.
Answer 04 questions only.

මෙම ප්‍රශ්න පත්‍රයේ අඩංගු ප්‍රශ්න සංඛ්‍යාව 07 කි
இந்த வினாப்பத்திரத்தில் 07 வினாக்கள் உள்ளன.
There are 07 questions in the question paper.

---

01. "ආපදා සහ සංවර්ධනය සම්පව බැඳී ඇත. ආපදාවන්ට සංවර්ධන මූලධර්මයන් විනාශ කිරීමටත් සංවර්ධන අවස්ථා නිර්මාණය කිරීමටත් හැකිය." මෙම ප්‍රකාශය සුදුසු උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 25)

02. (අ.) ආපදා කළමනාකරණයේ අරමුණු පහක් සඳහන් කරන්න. (ලකුණු 05)

(ආ) සුදුසු උදාහරණ සහිතව මෑත කාලීන ව්‍යසනවල විවිධ සමාජ ආර්ථික හා පාරිසරික ප්‍රතිවිපාක පැහැදිලි කරන්න.

(ලකුණු 20)

03. (අ) ව්‍යුහාත්මක සහ ව්‍යුහාත්මක නොවන (ඉංජිනේරු සහ ඉංජිනේරු නොවන) ආපදා අවම කිරීම වෙන්කර හඳුනාගන්න. (ලකුණු 10)

(ආ) ශ්‍රී ලංකාව තුළ අනුගමනය කරන ලද ගංවතුර අවම කිරීමේ විවිධ ව්‍යුහාත්මක උපාය මාර්ග සුදුසු නිදර්ශන සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 15)

04. (අ) වඩාත් හොඳ ආපදා කළමනාකරණයක් සඳහා ප්‍රජා සහභාගිත්වය අත්‍යාවශ්‍ය යැයි ඔබ සිතන්නේද? කරුණු පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ආ) ඔබ ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළ තීරයේ වෙරළබඩ ගම්මානයක ප්‍රජා සංවිධානයේ සාමාජිකයෙකු යැයි සිතන්න. ප්‍රබල සුනාමියක් සඳහා පූර්ව අනතුරු ඇඟවීමක් ලබා දෙන්නේ නම් ප්‍රජා සහ දේපළ ආරක්ෂා කිරීම සඳහා සුනාමියට පෙර සහ පසු ඔබ ගන්නා සියලුම ක්‍රියාමාර්ග ලැයිස්තුගත කරන්න. (ලකුණු 15)

05. (අ) ඵලදායි පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතියක් රටකට වැදගත් වන්නේ මන් දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(ආ) ජාතික සහ ප්‍රාදේශිය මට්ටමේ ආපදා පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතිය කෙරෙහි අවධානය යොමු කරමින් ශ්‍රී ලංකාවේ පූර්ව අනතුරු ඇඟවීමේ සන්නිවේදන පද්ධතියේ ක්‍රියාවලිය පැහැදිලි කරන්න. (ලකුණු 15)

06. (අ) ආපදා කළමනාකරණය/අඩු කිරීම සම්බන්ධව ජාත්‍යන්තර සංවිධාන පහක් ලැයිස්තුගත කරන්න.

(ලකුණු 05)

(ආ) ඉහත සඳහන් කල සංවිධානයන්ගෙන් එකක් තෝරා ගෙන එහි ගෝලීය ආපදා කළමනාකරණය/අඩු කිරීමේ ක්‍රියාවලියට වන දායකත්වය සාකච්ඡා කරන්න. (ලකුණු 20)

07. සුදුසු උදාහරණ සමගින් පශ්චාත් ආපදා කළමනාකරණ අවධින්හිදී දුරස්ථ සංනිවේදනය සහ මිනිසුන් රහිත ගුවන් වාහන (ඩ්‍රෝන) තාක්ෂණය ඵලදායී ලෙස භාවිත කළ හැකි ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 25)

******************************